# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2190/36 - 2020 අගෝස්තු මස 27 වැනි බ්‍රහස්පතින්දා - 2020.08.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: උදු 2/52/8.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය*: 13/97/FR/158.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම/පරවශ්‍යතාවය ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි. (දුම්බර කඳුවැටිය සංරක්ෂණ කිරීම සඳහා)

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ / පරවශ්‍යතාවේ විස්තර*:-

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කරඹකැටිය ග්‍රාම නිලධාරී වසම තුළ පිහිටි ලියන්කොබුල්ල වත්ත නම් වූ සර්වේ ජනරාල්ගේ අංක මු.පි. මහ 7002 දරන පිඹුරේ දක්වෙන කැබලි අංක 1 වශයෙන් දක්වෙන හෙක්ටයාර් 16.2420ක් වූ ඉඩම.

හිමිකම් කියන අය :-

එස්. එම්. ඉසෙඩ් කේ. ආබ්දීන් මයා, 70, එගොඩහේන, බොරුපන, රත්මලාන; ඒ. එස්. ඒ. සිද්දික් මයා, අංක 92, නුවර පාර, මඩවල කඩවීදිය, මඩවල; ඒ. එස්. එස්. ෆිර්දවුස් මයා, අංක 92, නුවර පාර, මඩවල කඩවීදිය, මඩවල; ඒ. එස්. එම්. මෆාස් මයා, අංක 92, නුවර පාර, මඩවල කඩවීදිය, මඩවල; ඒ. ඉසෙඩ් එම්. මනාසීර් මයා, අංක 92, නුවර පාර, මඩවල කඩවීදිය, මඩවල.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ **2020 නොවැම්බර් මස 25 වැනි දින** පෙ. ව. 10.00 ට, උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2020 නොවැම්බර් මස 18 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් / පරවශ්‍යතාවයන්ට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතු ය.

සුජානි ආර්. විජේතුංග,
ප්‍රාදේශීය ලේකම්,
උඩදුම්බර.

2020 අගෝස්තු මස 24 වැනි දින,
උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09 - 260